www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරයට බැඳෙන්න!

## Join the International Students for Social Equality!

ධනවාදය, එය 1930 ගනන්වල දී මුහුන දුන් මහා අවපාතයෙන් පසු දරුනු ම ආර්ථික, සමාජ හා දේශපාලන අර්බුදය විසින් ග්‍රහනයට ගනු ලැබ තිබේ. 20 වන සියවසේ සකල ව්‍යසන - එනම් මහා පරිමාන විරැකියාව, දරිද්‍රතාව, මිලිටරිවාදය සහ ලෝක යුද තර්ජනය - යලි ඉස්මතු වෙමින් තිබේ.

දෙවන ලෝක යුද්ධාවසානයෙන් පසු ප්‍රථම වතාවට මේ වසරේ ගෝලීය ආර්ථිකය හැකිලීමට නියමිත ය. සමාගම් වැසීයන හෝ ඒවායින් කම්කරුවන් දොට්ට දමන තතු යටතේ ලෝකය පුරා මිලියන 50 ක ජනතාවකගේ රැකියා අහිමි වීමට නියමිත ය. ලෝකය පුරා පුරුද්දක් ලෙස බඩගින්නේ සිටින ජනගහනය 2009 වසරේ දී මිලියන 100 කින් වැඩි වීමට නියමිතව තිබෙන්නේ කුසගින්නේ සිටින සමස්ත ජනගහනය බිලියන 1 ඉක්මවමිනි.

යුරෝපය තුල වැටුප් පහත වැටෙමින් හා සමාජ සුභසාධන කප්පාදු කෙරෙමින් ද, දශක ගනනාවක අරගලවලින් දිනාගත් සමාජ සහන අතුගා දැමෙමින් ද තිබේ.

ලෝක ධනවාදයේ හදවත වන ඇමරිකාවේ මුඩුක්කු නගර සහ ආහාර පෝලිම් දර්ශන පථයට පැමින ඇත. මිලියන ගනන් රැකියාවලින් දොට්ට දමනු ලැබ ශිෂ්ට සම්පන්න රැකියා සොයා ගත නො හැකිව සිටී. මහා ජනකායන්ගේ ජීවන කොන්දේසි දරාගත නො හැකි තැනකට පත්වෙමින් තිබේ.

මෙය මෙලෙස විය යුත්තේ ඇයි? ආර්ථික ජීවිතය පෙර නුවූ විරූ පරිමානයකින් ගෝලීය ලෙස ඒකාග්‍ර වීම සමග ආබද්ධව, විද්‍යාවේ සහ තාක්ෂනයේ දැවැන්ත අභිවර්ධනයෝ මානව සංවර්ධනයේ නව යුගයකට විභවය නිර්මානය කර ඇත්තාහ. තරුන ජනයා මුහුන දී සිටින්නේ **යුද්ධය හා අගහිගකමට ය**, දරිද්‍රතාව සහ ව්‍යාධීන්ගෙන් පිරුනු ලෝකයකට හා මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතීන් මත ප්‍රහාර එල්ල වීමට ය.

සියලු සලකාබැලීම් සංගත ලාභවලට සහ මහා ධනවතුන්ගේ පුද්ගලික ධනය සමුච්ඡය වීමට යටත් කරන ධනේශ්වර පද්ධතිය විසින් මානව ප්‍රගතියට බාධා කරනු ලබයි. ධනවාදය පලවා හැරිය යුතු ය.

සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) යනු කම්කරු පන්තියේ සමාජවාදී ව්‍යාපාරයක් - එනම් අවසානයේ නව යුගයේ විභවය හඳුනා ගන්නා, දරිද්‍රතාවය හා යුද්ධය අවසන් කරන හා අව්‍යාජ මානව නිදහසට හා සමානතාවට පදනම දමන ව්‍යාපාරයක් - ගොඩනැංවීමට කැපවූ ලෝකය පුරා සිටින ශිෂ්‍යයන්ගේ සංවිධානයකි.

ජාත්‍යන්තර සමාජවාදය සඳහා අරගලයට එක්වන්න! සසජාශි සමග එක්වන්න!

### කම්කරු පන්තියට එරෙහි ප්‍රහාරය

ඔබාමා පරිපාලනය විසින් නීත, ලෝකය පුරා ආන්ඩු ආර්ථික අර්බුදයට ප්‍රතිචාර දක්වා ඇත්තේ බැංකුවලට ඩොලර් ට්‍රිලියන ගනන් පොම්ප කිරීම තුලින්, අර්බුදයට වගකිව යුතු කෝටිපති මූල්‍යකරුවන්ගේ සාක්කුවලට එම මුදල් හරවා යවමිනි.

එක්සත් ජනපද ආන්ඩුව ඩොලර් ට්‍රිලියන 23 ක ආධාරයක් දෙන බවට බැංකුවලට සහතික වී ඇත. යුරෝපීය ආන්ඩු වාර්ෂික නිෂ්පාදනයෙන් තුනෙන් පංගුවක් බැංකුවලට දෙන බවට පොරොන්දු වී ඇත. මෙම මුදල් කොහෙන් හෝ ලැබීමට නියමිත අතර සමාජයේ අතිමහත් බහුතරය වන කම්කරු පන්තිය අවසානයේ එහි බරට කරගසනු ඇත. බැංකුවලට ඇප දීම සමග ආබද්ධව අත්‍යවශ්‍ය සමාජ සේවා හා වැටුප් කප්පාදුව පෙර නුවූ විරූ ලෙස ඉහලට පැන ඇත්තේ මේ නිසා ය.

ලෝකය පුරා මිලියන ගනන් කම්කරුවෝ හා ශිෂ්‍යයෝ ඔබාමාට සහාය දුන්නේ ඔවුන් බුෂ් පරිපාලනයේ ප්‍රතිපත්තිවලට එරෙහි වීමේ වාහකයක් ලෙස ඔහු සැලකූ නිසා ය. ඔබාමාට සහයෝගය දුන් අය දැන් ඔහු දැකගන්නේ හුදෙක් බුෂ්ගේ පිලිවෙත් අඛන්ඩව ගෙන යන අයෙක් ලෙස පමනක් නොව, ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් එතරම් වෛරය දනවන චරිතයක් බවට පත්කල පිලිවෙත් ම තීව්‍ර කරන අයෙක් ලෙස යි.

බලයට පත් තැන් පටන් ඔබාමා:

- බැංකුවලට ඩොලර් ට්‍රිලියන ගනනක් අමතරව ලබා දී ඇත.

■ අයවැය අර්බුදයන්ට මුහුන දී සිටින ප්‍රාන්තවලට සහයෝගය දෙනවා වෙනුවට දොට්ටදැමීම්, කම්කරු වැටුප් මත ප්‍රහාර එල්ලකිරීම්, විශ්ව විද්‍යාලවල අයකරන ගාස්තු ඉහල දැමීම් සහ මූලික සමාජ සේවාවන් කප්පාදුකිරීම් හරහා වියදම් කප්පාදුකිරීම හඳුන්වාදී තිබේ.

■ ඇෆ්ගනිස්ථානයේ යුද්ධය තීව්‍ර කර ඇති අතර පකිස්තානය තුල මිලිටරි ආක්‍රමනය පුලුල් තර තිබේ. ඉරාක ආක්‍රමනය නො කඩවා කරගෙන යනු ලැබේ. 2009 වසරේ මිලිටරි වියදම ඩොලර් බිලියන 640 ට ලඟා විය.

■ වධ බන්ධනවලට ලක්කිරීමේ සහ රහසේ දුරකථන ඇමතුම්වලට සවන්දීමේ පිලිවෙත් හඳුන්වා දුන් අය නීතිය ඉදිරියට ගෙන ඒම ප්‍රතික්ෂේප කරමින් එම පිලිවෙත් නො කඩවා කරගෙන යයි.

■ කම්කරුවන්ගේ රැකියා, වැටුප් සහ සහනාධාර කපාහැරීම සඳහා එක්සත් ජනපද වාහන කර්මාන්තවලට බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමට බලකොට ඇත .

මෙම ක්‍රියාවන් පෙන්වා දෙන්නේ ලෝකයේ කම්කරු පන්තිය ධනේශ්වර පක්ෂවලට ගැටගැසී සිටින තාක් දුරට කිසිවක් වෙනස් කල නො හැකි බවයි. තමන්ගේ අවශ්‍යතා සඳහා අරගල කිරීමට කම්කරුවන්ට සමාජවාදී හා ජාත්‍යන්තරවාදී පක්ෂයක් අවශ්‍ය ය. සසජාශි සටන් වදින්නේ එය ගොඩනැගීමටයි.

## ශිෂ්‍යයන් මුහුන දෙන අර්බුදය

ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා ආරක්ෂා කරගත හැක්කේ ජාත්‍යන්තර කම්කරු පන්තිය ධනවාදයට එරෙහිව බලමුලුගැන්වීම සඳහා කරන අරගලයේ කොටසක් ලෙස පමනි. ශිෂ්‍යයන් මුහුන දෙන ගැටලු - එනම් ඉහල යන ගාස්තු, නවාතැන් වියදම් හා වියැකී යන මූල්‍යාධාර - සමස්ත කම්කරුවන් මුහුන දී සිටින පුලුල් ගැටලු - එනම් විරැකියාව, සමාජ යටිතල පහසුකම් සෝදාපාලු වීම, වැටුප් සහ සහනාධාර මත එල්ල කෙරෙන ප්‍රහාර - සමග නො වෙන් කලහැකි ලෙස බැඳී පවතී.

බොහෝ ශිෂ්‍යයන්ට රැකියාවල නිරත වීමට සිදුව තිබෙන අතර බොහෝ දෙනා සෘජුව ම ඔවුන්ගේ විශ්ව විද්‍යාල වෙනුවෙන් වඩපල  කරති. කම්කරුවන් සහ ශිෂ්‍යයන් ලෙස ඔවුන්ගේ අවශ්‍යතා අභිසරනය වේ. සසජාශි සිය දේශපාලන  වැඩකටයුතු හුදෙක් විශ්ව විද්‍යාල මන්ඩප තුල පමනක් නොව පුලුල් කම්කරු පන්තික කොටස් අතර ද කරගෙන යයි.

කම්කරු පන්තිය වෙත හැරීම මගින්, වෘත්තීය සමිති නිලධරයන් සමග සංධාන ගොඩනැගීමක් ඇඟවුම් නො කරයි. කම්කරු පන්තියේ අරගලය වර්ධනය වනු ඇත්තේ, කම්කරු පන්තිය මත පොලිස්කාරකමේ යෙදෙමින් පන්ති අරගලය මර්ධනය කරන හා, හාම්පුතුන්ට සහන සලසා දෙමින්, සංගත කලමනාකරනයේ සහ රාජ්‍යයේ කනිෂ්ඨ සහකරුවා ලෙස කටයුතු කරන වෘත්තීය සමිති යාන්ත්‍රනයට එරෙහිව පමනි. දේශපාලනිකව ගත්කල මෙම සංවිධාන එක්සත් ජනපදයේ දී ඩිමොක්‍රටික් පක්ෂයටත්, ප්‍රන්සයේ දී සමාජවාදී පක්ෂයටත් ජර්මනියේ දී සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට හා හරිතයන්ටත් ධනේශ්වර පද්ධතිය රකින අනෙකුත් ධනේශ්වර පක්ෂවලටත් සහයෝගය දක්වති.

නිල වෘත්තීය සමිතිවලින් වෙන් වී, තම වැඩපොලවල ක්‍රියාකාරී කමිටු ද, තමන් වාසය කරන ප්‍රදේශවල කම්කරුවන් සහ තරුනයන් ඒකාබද්ධ කරන සටන් කමිටු ද ගොඩනගන ලෙස සසජාශි කියා සිටී.

## සමාජවාදී ක්‍රියාමාර්ගයක්

පන්ති අරගලය යලි ආරම්භ වීම ආර්ථික අර්බුදයේ නො වැලැක්විය හැකි සහ වෛෂයික ප්‍රතිඵලයකි. එහෙත් එය සාර්ථක වීමට නම් නව දේශපාලන මූලෝපායක් මගින් එය මෙහෙයවිය යුතු ය. කම්කරු ජනතාවන්ගේ සහ තරුනයන්ගේ අරගල විරැකියාවේ, දරිද්‍රතාවේ සහ යුද්ධයේ මූලාශ්‍රය වන ධනේශ්වර පද්ධතියට එරෙහිව සවිඥානිකව යොමු කල යුතු ය.

ලෝක ආර්ථිකයේ මූලික සංවිධානයේ ම රැඩිකල් වෙනසක් අවශ්‍ය ය. තව දුරටත් මනුෂ්‍යවර්ගයාගේ යෝධ නිෂ්පාදන බලවේග කෝටිපතියන් අතලොස්සකගේ පාලනය යටතේ තැබිය නො හැකි ය. කම්කරු ජනයා මුහුන දෙන දැවෙන ප්‍රශ්නවලට විසඳුමක් සොයා ගතහැකි වන්නේ පුද්ගලික ලාභය පිනිස නොව සමාජ අවශ්‍යතා සාක්ෂාත් කරගැනීම සඳහා ආර්ථික ජීවිතය සමාජවාදී ලෙස ප්‍රතිසංවිධානය කිරීම මගින් පමනි.

මහා අවපාතයෙන් පසු අන් කවරදාටත් වඩා අද්‍යතන ලෝකය අසමාන වේ. ලෝකයේ පොහොසත් ම සියයට එක පහල ම සියයට 57 ආදායමට සමාන පංගුවක් හිමි කර ගනී. ලොව ධනවත් ම පුද්ගලයින් තිදෙනා දිළිඳු ම සියයට 10 හි වත්කමට වඩා වැඩි කොටසකට හිමිකම් කියයි. ආර්ථික අර්බුදය ලෝකය පුරා කම්කරු පන්තියට සමාජ ව්‍යසනයක් නිර්මානය කරමින් තිබේ. සිත්නවීම් සහ නය ගැතිකම පෙර නුවූ විරූ මට්ටම්වලට නගිමින් තිබේ.

ධනයේ හිමිකාරීත්වය සහ බෙදාහැරීම පාලනය නො කර, දේශගුන වෙනස්කම් ඇතුලු කිසිදු සමාජ ප්‍රශ්නයක් විසඳනු ලැබිය නො හැක. මහා සංගත සහ බැංකුවල පුද්ගලික හිමිකාරීත්වය මානව අවශ්‍යතා මත ධාවනය වන ඒකාග්‍ර, තර්කානුකූල ආර්ථික සැලසුම්කරනය කල නො හැක්කක් බවට පත් කරයි.

පාසල්, නිවාස සහ රෝහල් යලි ගොඩනගන, සමාජ යටිතල පහසුකම් වැඩි දියුනු කරන සහ කම්කරුවන්ට

සහ තරුනයන්ට ප්‍රයෝජනයට ගතහැකි සංස්කෘතික ආයතන සම්පාදනය කරන වැඩකටයුතුවලට ජනතාව මෙහෙයවන, ලෝකයම අලලාගත් මහජන වැඩකටයුතුවලට ඩොලර් ට්‍රිලියන ගනන් ප්‍රතිපාදන වෙන් කල යුතු යයි සසජාහී කියා සිටී. ආර්ථික ජීවිතයේ මූලික ලීවරයන් වන මහා කාර්මික සමාගම්, බැංකු, ප්‍රවාහනය, සෞඛ්‍ය රක්ෂනය, විදුලි සන්දේශ ආයතන සහ කෘෂිකාර්මික ව්‍යාපාර කම්කරු ජනයාගේ ප්‍රජාතාන්ත්‍රික පරිපාලනය යටතේ ජනසතු කිරීමට අපි කැඳවුම් කරමු. සමාජීය සම්පත් සුපිරි ධනවතුන්ගේ හස්තයෙන් උදුරාගෙන ලෝක ජනගහනයේ අතිමහත් බහුතරය වන වැඩකරන මහා ජනතාවගේ පාලනය යටතේ තබමින්, ධනය යලි බෙදාහැරීම සඳහා අපි අරගල කරමු.

## ජාත්‍යන්තරවාදය සඳහා

ගෝලීයකරනය සමාජීය ධනය වැඩිකොට ඇත. ලෝකයේ සෑම අයෙකුට ම ශිෂ්ට සම්පන්න සහ අනවරතව වැඩි දියුනුවන ජීවන තත්වයක් ලබාදීමට හැකි වෛෂයික ආර්ථික හා තාක්ෂනික කොන්දේසි පවතී. ධනවාදයේ මූලික ලක්ෂන දෙක වන නිෂ්පාදන බලවේගයන්ගේ පෞද්ගලික අයිතිය සහ ලෝක ආර්ථිකය ජාතික රේඛා ඔස්සේ බෙදීම තුලින්, මිනිසාගේ නිෂ්පාදන බලවේග ප්‍රගතිශීලී ලෙස උපයෝගී කරගැනීමට සහ වර්ධනය කිරීමට බාධා කරයි. පුද්ගලික හිමිකාරීත්වය සහ ලාභය සඳහා නිෂ්පාදනය ද ජාතික රාජ්‍ය පද්ධතිය ද ප්‍රගතියට එරෙහි වන හා යෝධ සමාජ අසමානතාව සහ යුද්ධයේ හා ආඥාදායකත්වයේ භීතිය නිර්මානය කරන්නා වූ ඓතිහාසික බාධක වේ.

අප මුහුන දී සිටින කිසිදු ගැටලුවක් ජාතික තලයේ විසඳනු හෝ පොරබැදිය නො හැකි ය. මිනිසාගේ නිෂ්පාදන බලවේග ජාතික රාජ්‍යයේ පටු සීමාවන් ඉක්මවා වැඩී ඇත. අනෙක් අතට සෑම රටක ම වැඩකරන ජනතාව හා තරුනයන් මුහුන දෙන ගැටලු අතිමූලිකව එක සමාන ය. අර්බුදයට විසඳුමක් ඉදිරිපත් කල හැක්කේ එකම සැබෑ විප්ලවවාදී ජාත්‍යන්තර පන්තිය වන කම්කරු පන්තියට පමනි.

සෑම රටක් තුල දී ම සසජාශි ජාතිකවාදයට, ස්වෝත්තමවාදයට, වර්ගවාදයට සහ ආරක්ෂනවාදයට එරෙහි වේ. ඒවා භාවිතා කරනු ලබන්නේ විශේෂයෙන් ම අර්බුදයන්ගේ කාලවල දී කම්කරු පන්තිය බෙදා දුර්වල කිරීමට ය. සියලු රටවල කම්කරු පන්තිය මූල්‍ය වංශවතුන් සමාජය මත ආධිපත්‍යය දැරීමට එරෙහි පොදු අරගලයක් තුල අත්වැල් බැඳගත යුතු ය.

## මිලිටරිවාදයට හා යුද්ධයට එරෙහිව

ඉරාක යුද්ධය ඇරඹුනු තැන් පටන් දැන් වසර හතකට වඩා ගත වී ඇත. මෙම ආක්‍රමනකාරී අපරාධය, මිලියනයකට වැඩි ඉරාක වැසියන්ට මරු කැඳවා, සමස්ත සමාජයක් ම විනාශ කොට ඇත. එක්සත් ජනපද සොල්දාදුවන් 4,000 කට අධික සංඛ්‍යාවකගේ ජීවිත විනාශවී ඇති අතර, ඩොලර් බිලියන සිය ගනනක සම්පත් කාබාසිනියා කොට තිබේ. දැන් ඔබාමා පරිපාලනයේ අධීක්ෂනය යටතේ ඇෆ්ගනිස්තානයේ සහ ඉරාකයේ යුද්ධ බලගැන්වීම මගින්, ඇමරිකානු මූල්‍ය හා ව්‍යාපාරික ප්‍රභුව බලාපොරොත්තු වන්නේ තෙල් හා අනෙකුත් ස්වාභාවික සම්පත් වලින් අනූන ප්‍රදේශ අරා සිය මිලිටරි පාලනය තහවුරු කිරීම යි.

ඉරාකයෙන් සහ ඇෆ්ගනිස්තානයෙන් වහාම හා කොන්දේසි විරහිතව සියලුම එක්සත් ජනපද හා අනෙකුත් විදේශීය හමුදා ද වෙනත් පුද්ගලික කුලී හටයන් ද ඉවත් කල යුතු බවත්, ලෝකය පුරා කරගෙන යන එක්සත් ජනපද මිලිටරි ආක්‍රමනය අවසන් කල යුතු බවත් සසජාශි ඉල්ලා සිටී. එක්සත් ජනපද යුද යන්ත්‍රනය බිඳදැමිය යුතු අතර ඇමරිකානු බෝම්බ මගින් විනාශ කරන ලද සමාජයන්ට වන්දි ගෙවීමටත්, දේශීය වශයෙන් දැවෙන සමාජ අවශ්‍යතාවන් ඉටුකරලීමටත්, ඒ වෙනුවෙන් වැය කරන යෝධ මුදල් කන්දරාව යෙදවිය යුතු ය. අනෙකුත් සෑම අධිරාජ්‍යවාදී රටකට ම එම පිලිවෙත වලංගු වේ.

මිලිටරි ප්‍රචන්ඩත්වය, මර්ධනය සහ සූරාකෑම වෙනුවට සසජාශි ඉදිරිපත් කරන්නේ, සමස්ත වැඩකරන ජනයාගේ අන්‍යොන්‍ය සහෝදරත්වය සහ සහයෝගය මත පදනම් වූ සමාජවාදී විදේශ පිලිවෙතකි.

## ප්‍රජාතාන්ත්‍රිය අයිතීන්ගේ ආරක්ෂාව සඳහා

''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'' යන කඩතුරාවට මුවා වී ඇමරිකානු ආන්ඩුව, වධ බන්ධන පැමිනවීම, බොරු චෝදනා ගෙතීම, අවිනිශ්චිත කාලයක් රඳවාගෙන සිටීම, රහස් ඔත්තු බැලීම යනාදිය ඇතුලත් ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන් මාලාවක් සඳහා ආරම්භකත්වය ගෙන තිබේ. බොහෝකොටම විදේශීය විරුද්ධවාදීන්ට එරෙහිව උපයෝගී කරගන්නා මෙම පිලිවෙත්වල අවසන් ඉලක්කය වන්නේ ඇමරිකානු කම්කරු පන්තිය යි. විදේශීය යුද්ධ සහ සිය රටෙහි මහා පරිමාන විරැකියාව සහ දිලිඳුකමට එරෙහි වන කම්කරුවන්ට සහ ශිෂ්‍යයන්ට එරෙහිව ප්‍රචන්ඩත්වය සහ මර්දනය දියත්කිරීම සඳහා පොලිස් රාජ්‍ය රාමුවක් ඉදිකෙරෙමින් තිබේ.

මෙම සියලු වැඩපිලිවෙලවල් වහා ම අවසන් කිරීමට ද මූලික ප්‍රජාතාන්ත්‍රිය හා ව්‍යවස්ථාමය අයිතීන් පුනස්ථාපනය කිරීම සඳහා ද සසජාශි කැඳවුම් කර සිටී. වධ බන්ධන පැමිනවීමට නියම කල සියලු ප්‍රධාන රජයේ නිලධාරීන් අත්අඩංගුවට ගෙන නීතිය ඉදිරියට පමුනුවන ලෙස අපි කැඳවුම් කියා සිටින්නෙමු. ඩිමොක්‍රටික් පක්ෂයේ ප්‍රධාන සාමාජිකයින් ද ඇතුලු මෙම අපරාධ පිලිබඳව දැන දැනම ඒවා රහසේ තබාගත් සියලු දෙනාට එරෙහිව චෝදනා ගොනු කල යුතු වේ.

## මාක්ස්වාදය සහ භෞතිකවාදය සඳහා

දශක ගනනාවක් පුරා විශ්ව විද්‍යාල මන්ඩප තුල ආධිපත්‍යය දරා ඇත්තේ පශ්චාත් නූතනවාදය සහ එහි සහචර ධාරාවන්ගේ බංකොලොත් දෘෂ්ටිවාදය යි. මෙම දර්ශනවාදයන්ගේ පදනමේ පවත්නේ විද්‍යාව, ප්‍රගමනය සහ වෛෂයික සත්‍යය ප්‍රතික්ෂේප කිරීම යි. පුනරුදයේ බුද්ධිමය උරුමයෙහි හා නූතන යුගයේ මාක්ස්වාදය තුල මූර්තිමත් වන භෞතිකවාදී දර්ශනවාදයේ පුනරුදයක් සඳහා සසජාශි අරගල කරයි.

සමාජවාදය නැගී එන්නේ බොහෝ කාලයකට පෙර සියලු ප්‍රගතිශීලී භූමිකාවන් අභිමිකරගත් සමාජ පද්ධතියක් වන ධනවාදයේ පරස්පරවිරෝධයන්ගේ ඓතිහාසික අවශ්‍යතාවක් ලෙසිනි. මනුෂ්‍ය වර්ගයාගෙන් අතිමහත් බහුතරය වන කම්කරු පන්තියේ වෛෂයික අවශ්‍යතාවන්වලට සමාජවාදය අනුරූපී වන නිසා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක වර්ධනය පිලිබඳව නො සෙල්විය හැකි විශ්වාසයක් සසජාශි වෙත තිබේ.

## කම්කරු පන්තියේ ස්වධීන සමාජවාදී ව්‍යාපාරයක් සඳහා

බුෂ් සහ රිපබ්ලිකානුවන් මෙන් ම ඔබාමා සහ ඩිමොක්‍රටිකයින් ද නියෝජනය කරන්නේ කම්කරු පන්තිය නොව ධනේශ්වර ස්වාමීන්ගේ සහ මූල්‍යකරුවන්ගේ ප්‍රභූ පැලැන්තිය යි. බ්‍රිතාන්‍යයේ සහ ඕස්ට්‍රේලියාවේ කම්කරු පක්ෂ, ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, ප්‍රංශයේ සමාජවාදී පක්ෂය හා ඒ සමාන අනෙකුත් ධනේශ්වර පක්ෂ සම්බන්ධයෙන් ද මෙය සත්‍ය වේ.

මෙම පක්ෂවලට ''ක්‍රියාකාරී වීම'' සඳහා පීඩනය යෙදීමේ පිලිවෙත සසජාශි ප්‍රතික්ෂේප කරයි. එම ඉදිරිදර්ශනය බංකොලොත් ය. අපගේ ඉලක්කය වන්නේ දේශපාලන බලය සඳහා -එනම් සමාජය ප්‍රජාතාන්ත්‍රික, සමානාත්මතා සහ තර්කානුකුල පදනමක් මත ප්‍රතිනිර්මානය කිරීමට කම්කරුවන්ගේ ආන්ඩුවක් ස්ථාපනය කිරීමට- පැහැදිලි හා සමවබෝධිත න්‍යායික ඉදිරිදර්ශනයක් මත පදනම්ව, කම්කරු පන්තියේ මහජන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම යි. කම්කරු පන්තියට තමන්ගේ ම පක්ෂය, තමන්ගේ ම ක්‍රියාමාර්ගය සහ තමන්ගේ ම හඬ අවශ්‍ය ය. ලෝකය පුරා සමාජවාදී සමානතා පක්ෂ සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩනැගීම සසජාශිට අවශ්‍ය වන්නේ මේ නිසා ය.

ප්‍රංශයේ නව ධනේශ්වර විරෝධී පක්ෂය, ජර්මනියේ වාමාංශික පක්ෂය සහ එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සමාජවාදී සංවිධානය වැනි සියලු වර්ගයේ මධ්‍යම පන්තික විරෝධතා ව්‍යාපාර සතුව ඇත්තේ මෙයට ප්‍රතිවිරුද්ධ වැඩපිලිවෙල යි. මෙම කන්ඩායම් සංස්ථාපිත ධනේශ්වර පක්ෂවල විරුද්ධවාදීන් ලෙස පෙනී සිටින නමුත් යථාර්ථයේ දී කම්කරුවන් එම පක්ෂවලට බැඳ තබති.

සමාජයේ අතිමූලික පන්ති බෙදීම්වලට ඉහලින් වර්ගය, ආගම, ජාතික ප්‍රභවය, ලිංගිකත්වය හෝ ලිංගික දිශානතිය ආදිය තබන මධ්‍යම පන්තික "වමේ" සහ ලිබරල් කන්ඩායම්වල අමුද්‍රව්‍යයක් වන අනන්‍යතා දේශපාලනය සසජාශි විසින් ප්‍රතික්ෂේප කරනු ලබයි. දේශපාලනයේ ගාමක බලය වන්නේ පන්ති අරගලය යි. අර්බුදයට ශක්‍ය ප්‍රතිචාරයක් ඉදිරිපත් කලහැකි වන්නේ මෙම කරුන හඳුනාගැනීම හරහා පමනි.

ශතවර්ෂයකට වැඩි කම්කරු පන්තියේ අරගලයේ මූලෝපායික අත්දැකීම්වල පාඩම් මත පදනම් වන ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක පුනර්ජීවනය සඳහා අපි අරගල කරමු. 20 වන ශතවර්ෂය තුල, සමාජවාදය සඳහා කල ශ්‍රේෂ්ඨ විප්ලවවාදී අරගල දැකගත හැකි වුව ද, ඒවා ස්ටැලින්වාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සහ පැරනි කම්කරු ව්‍යාපාරවල නිලධරයන් විසින් පාවාදෙන ලදී. ප්‍රතිඵලය වූයේ ලෝක යුද්ධ දෙකක් සහ ෆැසිස්ට්වාදය යි. මෙය යලි වතාවක් සිදුවීමට ඉඩ නො තැබිය යුතු ය.

සසජාශි සිය පරම්පරාව ලෙස දැකගන්නේ ජාත්‍යන්තර සමාජවාදයේ ශ්‍රේෂ්ට චරිත වන කම්කරු පන්තියේ ස්වාධීන විප්ලවවාදී පක්ෂය ගොඩනැඟීමට සිය ජීවිත කාලයම කැපකල මාක්ස්, එංගල්ස්, ලෙනින්, ලක්සම්බර්ග් හා ට්‍රොට්ස්කි ය. 1920 හා 1930 ගනන්වල සෝවියට් සංගමය තුල මතු වූ ප්‍රතිවිප්ලවවාදී ස්ටැලින්වාදී නිලධාරී තන්ත්‍රයට විරුද්ධව ජාත්‍යන්තර සමාජවාදයේ ක්‍රියාමාර්ගය සඳහා අරගලයට නායකත්වය දුන් ලියොන් ට්‍රොට්ස්කි විසින් 1938 දී ස්ථාපනය කරන ලද සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩනැගීමට අපි අරගල කරමු.

සමාජවාදය යන්නෙන් අදහස් වන්නේ සමාජයේ නිෂ්පාදන බලවේග ප්‍රජාතාන්ත්‍රික පාලනයට නතුකිරීම සහ සූරාකෑමේ හා අසමානතාවයේ ධනේශ්වර පද්ධතිය අවසන් කිරීමයි. මානව ජීවිතයේ සෑම අංශයක් ම වෙලඳපොල මගින් නීර්නය කරනු ලබනවා වෙනුවට සමාජයේ ප්‍රමුඛතාවන් සමාජීය අවශ්‍යතාවය තුලින් නීර්නය කරනු ලැබිය යුතු ය. මෙය ඉෂ්ට කිරීමේ කර්තව්‍යය පැවරෙන්නේ කම්කරු පන්තියට හා එහි විප්ලවවාදී සමාජවාදී පක්ෂයට යි. මාක්ස්වාදය කම්කරු පන්තිය තුලට ගෙනයාමට කරන සවිඥානික අරගලයකින් පිටස්තරව සමාජවාදය උදාකර ගත නො හැක. ව්‍යාපාරයක් ගොඩනැගිය යුතු අතර අරගලයක් දියත් කල යුතු ය. මෙම අරගලය ඉදිරියට ගෙන යන ලෙසත් සසජාශි ගොඩනගන ලෙසත් අපි ශිෂ්‍යයන් හා තරුනයන් කැඳවුම් කරන්නෙමු.

## සමාජවාදය සඳහා අරගලයට එක් වනු!

## සසජාශි ගොඩනගනු!

සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ යනු සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජාජාක) ශිෂ්‍ය ව්‍යාපාරය යි. හජාජාක ලෝකයේ පුලුල්ව කියවනු ලබන සමාජවාදී ප්‍රකාශනය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පලකරයි. මෙම ප්‍රකාශනය සමග එකඟ වන සියලු ශිෂ්‍යයන්ට *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ක්‍රියාමාර්ගය, ඉතිහාසය සහ විශ්ලේෂන ගැඹුරින් අධ්‍යයනය කරන ලෙස අපි ඉල්ලා සිටිමු. සසජාශි වෙත බැඳීමට සහ එය ගොඩනැගීමට තීරනය ගෙන ඉදිරියේ එන කාල පරිච්ඡේදයට දේශපාලනිකව සූදානම් වන්න. සසජාශි ශාඛාවක් ඔබගේ විද්‍යාලයේ හෝ විශ්ව විද්‍යාලයේ ගොඩනැගීමට උදවු කරන්න. සමාජවාදය සඳහා අරගලයට එක්වන්න.

© www.wsws.org